ඇමුණුම 01

# ගිවිසුම් පත්‍රය

## <u>ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම.</u>

මෙහි පහත ඇතැම් තැනෙක "පළමු පාර්ශ්වය" ලෙස හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ........................................................ (අමාත්‍යාංශයේ නම) ලේකම් ........................................................(නම) සහ මතුවට ........................................ (අමාත්‍යාංශයේ නම) ලේකම් වශයෙන් හඳුන්වනු ලබන යම් තැනැත්තෙකු එක් පාර්ශ්වයකට ද,

මෙහි "දෙවන පාර්ශ්වය" ලෙස හඳුන්වනු ලබන පහත නම් සඳහන් අය/ නිලධරයා අනෙක් පාර්ශ්වයට ද බැඳී එකී දෙපාර්ශ්වය අතර වර්ෂ.....................ක් වූ ....................මස............ දින........................දී ඇතිකරගත් ගිවිසුම් පත්‍රයයි.

ඉහත කී පළමු පාර්ශ්වය විසින්, ඉහත කී දෙවන පාර්ශ්වය වන ........................................................(නිලධරයාගේ ස්ථිර ලිපිනය) හි පදිංචි........................................................(අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව) හි ............................................ තනතුර දරන .......................... (නිලධරයාගේ සම්පූර්ණ නම) යන අයට පහත සඳහන් කොන්දේසි සහ බැඳීම් වලට යටත්ව රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් වන ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට අගතියක් නොවන පරිදි දේශීය හෝ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාදීම අනුමත කරනු ලැබේ.

එකී කොන්දේසි සහ බැඳීම කවරේ ද යත්,

01) නිලධරයා විසින් වැටුප් රහිත දේශීය/විදේශීය නිවාඩු අනුමත කර ගැනීමේ දී නිසි ක්‍රමවේදය අනුගමනය කිරීමට වගබලා ගත යුතු ය.

02) නිලධරයා විසින් ලබා ගන්නා ඉහත කී දේශීය/විදේශීය නිවාඩු කාලය (................) දින සිට (..............) දක්වා වන අතර, එකී නිවාඩු කාලය උපරිම වසර (01/05)* කට සීමා විය යුතු ය. (ලබා ගන්නා වැටුප් රහිත නිවාඩු කාලසීමාව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හි 03 ඡේදය අනුව නම් උපරිම වසර 01කට ද, එම 02 ඡේදය අනුව නම් උපරිම වසර 05කට ද සීමා විය යුතු ය.)
* අදාළ නොවන අංකය කපා හරින්න

03) නිලධරයා දේශීය/විදේශීය නිවාඩු අනුමතකර ගැනීමේ දී ඉහත කී විධිවිධාන ඇතුළත් ........................දිනැති අංක.........................දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙ හි සඳහන් විධිවිධාන එපරිදි ම අවශ්‍යතාවය අනුව අනුගමනය කිරීමට වග බලා ගත යුතු ය.

04) ඉහත කී චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත් නිලධරයාගේ ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට ඇති හිමිකම අහිමි වනු ඇත.

ඉහත කී කොන්දේසි සහ බැඳීම් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එබඳු අවස්ථාවක දී අදාළ බලධරයින් විසින් ගනු ලබන ඕනෑම විනය හා නෛතික ක්‍රියාමාර්ගයකට නිලධරයා යටත් වනු ඇත.

ඊට සාක්ෂි පිණිස ඉහත කී පළමු පාර්ශ්වකාර........................................................................................අමාත්‍යාංශයේ ලේකම්............................................................ (නම) හා දෙවන පාර්ශ්වකාර ........................................................ ........................................... (නිලධරයාගේ සම්පූර්ණ නම) යන දෙපාර්ශ්වය විසින් වර්ෂ .....................ක් වූ ....................... මස ........... දින අත්සන් තබන ලදි.

1) පළමු පාර්ශ්වය ................................ (අත්සන)
................................ (ජා.හැ.අංකය)
................................ (නිල මුද්‍රාව)

2) දෙවන පාර්ශ්වය ................................ (අත්සන)
................................ (ජා.හැ.අංකය)

සාක්ෂි

1) ........................................... (අත්සන)
........................................... (නම) ..............................(ජා.හැ.අංකය)
........................................... (ලිපිනය)

2) ........................................... (අත්සන)
........................................... (නම) ..............................(ජා.හැ.අංකය)
........................................... (ලිපිනය)